# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,525 - 2007 නොවැම්බර් 23 වැනි සිකුරාදා - 2007.11.23

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1092 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... .. | — |
| මිළ පාලන දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 1093 |
| නැවියන්ට දැන්වීම් .. ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


*සැ. යු.*– (i) අපි වෙනුවෙන් අපි අරමුදල පනත් කෙටුම්පත 2007 නොවැම්බර් මස 02 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) රණවිරු සේවා අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත 2007 නොවැම්බර් මස 02 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය පිහිටුවීම පනත් කෙටුම්පත, 2007 නොවැම්බර් මස 02 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 නොවැම්බර් මස 30 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 නොවැම්බර් මස 16 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2007 අංක 468

**ශ්‍රී ලංකා ශිෂ්‍යභට බලකාය**

**අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීම්**

*2005 ජුනි මස 30 වැනි දින සිට ලුතිනන් කර්නල් වශයෙන්-*

නි/3052 මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) එස්කේබී වීරකෝන්,
නි/3053 මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) එච්එම්එස්බී හේරත්,
නි/3055 මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) එච්පීජීජ් අල්විස්,
නි/3119 මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) ආර්එම් ප්‍රේමදාස.

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 නොවැම්බර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

11–796

2007 අංක 469

DVF/RECT/264AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව– ස්වේච්ඡා බලසේනාව**

**මරණයෙන් පසු අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීමක්**

පහත නම සඳහන් නිලධාරී 2006 නොවැම්බර් මස 18 වැනි දින සිට මේජර් නිලයට මරණයෙන් පසු උසස් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත :

කපිතන් දොන් සංජය කුමාර වැලිකල, ශ්‍රීලකාහ (නි/5049).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ජනවාරි මස 09 වැනි දින,
කොළඹ දී ය.

11–801

---

2007 අංක 470

DVF/RECT/269/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව– ස්වේච්ඡා බලසේනාව**

**අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැන්වීමක්**

පහත නම සඳහන් නිලධාරී 2006 නොවැම්බර් මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත :

ලුතිනන් ප්‍රේම ජයන්ත උදලාගම, ශ්‍රීලංසංබ (නි/5407).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

11–802

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## සීමාසහිත සෙලාන් බැංකුව-බණ්ඩාරවෙල ශාඛාව

1990 අංක 04 දරන බැංකු ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, 2004.09.29 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතික ව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගිණුම් අංකය : 0460-07427070-101.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් සුහයිරා පාලික් විසින් සහතික කරන ලද 2001 අගෝස්තු මස 07 දිනැති අංක 35 සහ 2002 අප්‍රේල් මස 09 දිනැති අංක 99 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම්, බණ්ඩාරවෙල, කුරුප්පු මුදියන්සේලාගේ විජේකෝන් බණ්ඩා යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් එක්ලක්ෂ තිස්පන්දහස් දෙසිය තිස්නවයයි ශත අසූවක (රු. 1,35,239.80) මුදලක්, 2004 අප්‍රේල් මස 30 වැනි දින වැනි විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 1,35,239.80 මුදල ද, 2004 මැයි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසි හය (26%) බැගින් වූ පොලිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 35 සහ 99 දරන බැඳුම්කර මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුඹල්වෙල කෝරළේ ඉඩමේගම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එම්. සමරසේකර විසින් සාදන ලද 1986.11.18 දිනැති අංක 1030 දරන සැලැස්මේ කැබලි අංක 14 ලෙස පෙන්නුම් කරනු ලබන ස්ට්‍රෙඩ්ඩන් එස්ටේට් නමැති බෙදා වෙන් කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : කැබැලි අංක 13 සහ පාර ද, නැගෙනහිරට : කැලෑව සඳහා තබන ලද වෙන් කිරීම ද, දකුණට : කැබැලි අංක 15 සහ බස්නාහිරට : කැබැලි අංක 13 සහ පාර ද යන මායිම් තුළ අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් තිස් නවයක් (අ. 1, රූ. 1, පර්. 39) විශාල, එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය 2001.07.26 දිනැති අංක 6141 දරන සැලැස්ම මගින් නැවත මැන ඇති අතර එය එකී සැලැස්මේ කැබැලි අංක 1 ලෙස පෙන්නුම් කර ඇති අතර එයට මායිම්, උතුරට : 1986.11.18 දිනැති අංක 1030 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 13 ද, නැගෙනහිරට : කැලෑව සඳහා තබන ලද වෙන් කිරීම ද, දකුණට : එකී අංක 1030 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 15 සහ බස්නාහිරට : එකී අංක 1030 දරන සැලැස්මේ සඳහන් කැබලි අංක 13 ද යන මායිම් තුළ එකී අංක 6141 දරන සැලැස්ම අනුව අක්කර එකයි, රූඩ් එකයි, පර්චස් තිස්නවයක් (අ. 1, රූ. 1, පර්. 39) විශාල එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජේ 129/156 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

11-721/1

---

## රුහුණ සංවර්ධන බැංකුව - කැකණඳුර ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන *අති විශෙෂ ගැසට් නිවේදනයට* අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2007.05.29 දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතික ව සම්මත කරන ලදි :–

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් සරෝජිනී වික්‍රමසිංහ මහත්මිය විසින් සහතික කරන ලද 2005.07.20 දිනැති අංක 4124 දරන උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, "සිරි නිවස" තලල්ල, (උතුර) කැකණඳුර ලිපිනයේ පදිංචි ජොනික්කුහේවා ප්‍රේමසිරි මහතා සහ පල්ලේගෙදර මුදියන්සේලාගේ ධම්මිකා ප්‍රියන්ති බණ්ඩාර මහත්මිය යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ අනූදහස් තුන්සියයක (රු. 90,300) මුදලක් රුහුණ සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින් ද, 2006.06.22 වැනි දින සිට වර්ෂයකට 20% බැගින් රුපියල් අනූදහස් තුන්සීයයක (රු. 90,300) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි වියදම් ද සමඟ අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවා අඩුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 4124 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, තලල්ල (උතුරේ) පිහිටි ගොඩේරුප්ප නමැති ඉඩමේ ඒකාබද්ධ කැබලි වන, අංක 07, 08 සහ 09 දරන කැබලි සම්බන්ධයෙන් 1999.09.09 වැනි දින කේ. ජී. එස්. යාපා මානක තැනගේ අංක 2804 දරන සැලැස්ම ප්‍රකාර බෙදා වෙන්කළ "සී" අක්ෂරය දරන කැබැල්ල, උතුරට : අංක 2804 දරන සැලැස්මේ "ඒ" සහ "බී" අක්ෂර දරන කැබැලි ද, නැගෙනහිරට : මුල් ඉඩමේ අංක 15 දරන අඩි 12ක් පළල ප්‍රවේශ මාර්ගය ද, දකුණට : අංක 2804 දරන සැලැස්මේ "ඩී" අක්ෂරය සහ මුල් ඉඩමේ අංක 10 දරන කැබැල්ල ද, බස්නාහිරට : අංක 06 දරන කැබැල්ල ද මායිම් වූ පර්චස් විසිනවයයි දශම එකයි පහක් (අ. 0, රූ. 0, පර්. 29.15) විශාල ඉඩමේ ගහකොළ, පළතුරු සමඟ එහි පිහිටි ගොඩනැගිලි ද වේ.

මෙම ඉඩමට ගමන් කිරීමට ඇති අංක 15 දරන ප්‍රවේශ මාර්ගය පාවිච්චි කිරීමේ අයිතිය, බලය සහ මාර්ග පරවශතාවය ද වේ.

මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ 2005.07.20 වැනි දින B552/268හි ලියාපදිංචි ව ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සරත් රත්නායක,
සභාපති.

2007ක් වූ මැයි මස, 29 වැනි දින,
රුහුණු සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය,
පඹුරන, මාතර.

11-769

---

## මහජන බැංකුව - හලාවත ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.07.27 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

මාරවිල ප්‍රසිද්ධ නොතාරිස්, රුවිනි, ඒ. එස්. දසනායක මහත්මිය විසින් සහතික කරන ලද 2003.07.02 දිනැති අංක 736 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කාදර් මුයියදීන් මුහම්මදු සරීෆු යන අයවලුන් විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරයන් යටතේ දැනට රුපියල් අටලක්ෂ හතලිස් දෙදහස් හැට හතයි ශත හතලිස් නවයක (රු. 8,42,067.49) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2006.08.19 දින සිට වර්ෂයකට 18.5% බැගින් රුපියල් අටලක්ෂ හතලිස් දෙදහස් හැට හතයි ශත හතලිස් නවයක (රු. 8,42,067.49) මුදල සඳහා ද, වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් (29) වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම්, ඒවා අඩුව එකී රුපියල් අටලක්ෂ හතලිස් දෙදහස් හැටහතයි ශත හතලිස් නවයක (රු. 8,42,067.49) මුදල අයකර ගැනීම සඳහා මීගමුව බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා මහතා විසින් එකී අංක 736 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, පුත්තලම් දිස්ත්‍රික්කයේ, හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කොටසට අයත් මුන්දලම කොට්ඨාසයේ, ආනවිලුන්දන් පත්තුවේ, තාරකුඩි විල්ලු නමැති ගමේ පිහිටි තාරකුඩිවිල්ලුයාය නමැති ඉඩමට එස්. වොට්ෂන් පෙරේරා බලයලත් මානක තැන විසින් 1990 දෙසැම්බර් මස 15 වැනි දින සාදන ලද අංක 1019 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 25ඒ දරන කොටසට මායිම්, උතුරට : ගම්සභා පාර ද, නැගෙනහිරට : ලොට් අංක 25බී දරන කොටස ද, දකුණට : ලොට් අංක 53 දරන කොටස ද, බස්නාහිරට : ලොට් අංක 26 දරන කොටස යන මායිම් තුළ වූ ප්‍රමාණයෙන් අක්කර එකයි, රූඩ් බින්දුවයි, පර්චස් විසිතුනක් (අ. 1, රූ. 0, පර්. 23) විශාල ඉඩමේ බිම සහ ඊට අයත් ගහකොළ, පළතුරු, ගොඩනැගිලි යනාදී සෑම සියලුදේත් සමඟ වේ.

මෙය හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ආර් 54/41 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
හලාවත.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 79, මාරවිල පාර,
නාත්තන්ඩිය.

11-740

---

## මහජන බැංකුව - කොග්ගල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.10.20 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :-

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් හොරදුගොඩ ගමගේ සෝමපාල විසින් සහතික කරන ලද 2004.10.28 දිනැති අංක 611 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, දීගොඩ ගමගේ සුදත් ප්‍රේමචන්ද්‍ර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් හාරලක්ෂ තිස්පන්දහසක (රු. 4,35,000) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද 2005.01.27 දින සිට වර්ෂයට 18.25% බැගින් රුපියල් හාර ලක්ෂ තිස්පන්දහසක (රු. 4,35,000) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා වෙන්දේසි ගාස්තු සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හාරලක්ෂ තිස්පන්දහසක (රු. 4,35,000) මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 611 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන්, ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ, මලල්ගොඩපිටිය පිහිටි මාරගහකොරටුව *නොහොත්* වැවේවත්ත නමැති ඉඩමෙන් බෙදා වෙන් කළ කැබලි අංක 05 සඳහා බලයලත් මිනින්දෝරු අජිත් රංජන් වීරසූරිය විසින් 1994.08.15, 1994.10.04, 1994.10.21 සහ 1994.12.22 යන දිනවලදී මැන සාදන ලද අංක 380ඒ දරන පිඹුර ප්‍රකාර අංක 05 දරන කැබැල්ලට මායිම්, උතුරට : මෙම ඉඩමේ කැබලි අංක 07 ද, නැගෙනහිරට : මෙම ඉඩමේ කැබලි අංක 04 ද, දකුණට : කජුගහකොරටුව ද, බස්නාහිරට : මෙම ඉඩමේ කැබලි අංක 06 ද යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් එකයි, පර්චස් පහළොවයි දශම

හතරයි දෙකක් (අ. 0, රූ. 1, පර්. 15.42) විශාල ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැටිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේද වේ.

මෙම ඉඩම ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඩී 878/131 යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහළ ඩික්සන් පාර,
ගාල්ල.

11-741

---

## මහජන බැංකුව - ගාල්ල කොටුව ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.08.23 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :-

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් එම්. ජී. සී. අරෝෂිනී විසින් සහතික කරන ලද 2006.04.10 දිනැති අංක 1110, 1111 දරන උකස්කර හා 2007.01.31 දිනැති අංක 1759 දරන උකස්කරය සහ ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් අජන්තා කපුගමගේ විසින් සහතික කර ලද 2006.12.22 දිනැති අංක 1152 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, ලොකු සාටු හේවා උපාලි සුනිල් සුරේන්ද්‍රසිංහ යන අය විසින් පැහැර හැර බැවින් ද, එකී උකස්කර යටතේ දැනට රුපියල් තුන්ලක්ෂ හතළිස් දහසයි ශත හයක (රු. 3,40,000.06), රුපියල් හය ලක්ෂයක් (රු. 6,00,000) රුපියල් ලක්ෂ පහක් (රු. 5,00,000) සහ රුපියල් තුන්ලක්ෂ අසූතුන්දහස් අටසිය පනස් හතයි ශත හැත්තෑ අටක (රු. 3,83,857.78) මුදල් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, 2007.01.13 දින සිට වර්ෂයකට 20.5% බැගින් රුපියල් තුන්ලක්ෂ හතළිස් දහසයි ශත හයක (රු. 3,40,000.06), 2007.05.01 දින සිට වර්ෂයකට 21.5% බැගින් රුපියල් හය ලක්ෂයක (රු. 6,00,000), 2007.01.08 දින සිට වර්ෂයකට 22% බැගින් රුපියල් පන්ලක්ෂයක (රු. 5,00,000) සහ 2007.05.01 දින සිට වර්ෂයකට 34% බැගින් රුපියල් තුන්ලක්ෂ අසූතුන්දහස් අටසිය පනස් හතයි ශත හැත්තෑ අටක (රු. 3,83,857.78) මුදල් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29එල් (29L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් තුන්ලක්ෂ හතළිස් දහසයි ශත හයක (රු. 3,40,000.06), රුපියල් හය ලක්ෂයක් (රු. 6,00,000), රුපියල් ලක්ෂ පහක් (රු. 5,00,000) සහ රුපියල් තුන්ලක්ෂ අසූතුන්දහස් අටසිය පනස් හතයි ශත හැත්තෑ අටක (රු. 3,83,857.78) මුදල අයකර ගැනීම සඳහා බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද විසින් එකී අංක 1110, 1111, 1759 සහ 1152 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාලු කඩවත් සතර තුළ ගාලු මහනගර සභා සීමාවට අයත්, ගාලු පියද්දේ පිහිටි මහවත්ත නමැති ඉඩමේ 1/7 කොටසට බලයලත් මිනින්දෝරු සිසිර අමේන්ද්‍රගේ 2000.02.21 දිනැති අංක 943 දරන පිඹුර ප්‍රකාර අංක ඒ දරන කැබැල්ලට මායිම් උතුරට : කච්චුවත්ත පාර සහ දලුවත්ත *නොහොත්* ළමාහේවගේවත්ත ද, නැගෙනහිරට : දලුවත්ත *නොහොත්* ළමාහේවගේවත්ත ද, දකුණට : මෙම ඉඩමේ අංක 3 දරන කැබැල්ලේ ඉතිරි කොටස ද, බස්නාහිරට : කච්චුවත්ත පාර ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහඅටයි දශම තුනක් (අ. 0, රූ. 0, පර්. 18.3) විශාල ඉඩමේ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියලු දේද වේ. මෙය ගාල්ල ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ඒ 574/265 දරන පත්‍රිකාවේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
ගාල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 22, පහළ ඩික්සන් පාර,
ගාල්ල.

11-742

---

## ඩීඑෆ්ජ්සීසී වර්ධන බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර ඩීඑෆ්ජ්සීසී වර්ධන බැංකුව මගින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය

සීමාසහිත ඩීඑෆ්ජ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ :-

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව නමට, කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. එන්. කේ. ඉලංගන්තිලක විසින් ලියා සහතික කළ අංක 462 හා 2004.07.27 වැනි දින දරන උකස් බැඳුම්කරය මත හා කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එෆ්. ජේ. සී. ඩබ්ලිව්. පෙරේරා විසින් ලියා සහතික කරන ලද අංක 807 හා 2005.08.16 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, රුවන්වැල්ලේ විකිතන්තිරි මහසාමිලාගේ පන්ඩුල ගුණසේකර යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2007 මැයි මස 31 වැනි දිනට එකී විකිතන්තිරි මහසාමිලාගේ පන්ඩුල ගුණසේකර යන අයගෙන් ඩීඑෆ්ජ්සීසී වර්ධන බැංකුවට එකී උකස් බැඳුම්කර මත රුපියල් විසිහය ලක්ෂ හැත්තෑ නව දහස් හතලිස් හයකුත් ශත තිස් අටක (රු. 26,79,046.38) මුදලක් සහ 2007 ජූනි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් විසිහතර ලක්ෂ හැත්තෑ නව දහස් තුන්සිය තිස්හයකුත් ශත අනූ එකක් (රු. 24,79,336.91) සඳහා වර්ෂයට සියයට විසිහත (27%) බැගින් පොලිය ද, රුපියල් තිස්දෙලක්ෂ හැත්තෑ අටදහස් හත්සිය අනූපහකුත් ශත විසිපහක (රු. 32,78,795.25) මුදලක් සහ 2007 ජූනි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා ඒ සඳහා වර්ෂයකට සියයට තිස්හය (36%) බැගින් හෝ එම ණය පහසුකමට අදාළ වන වෙනත් අනුපාතිකයක් මත පොලිය ද ලැබිය යුතුව හා අයවිය ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන, රුපියල් විසිහය ලක්ෂ හැත්තෑ නවදහස් හතළිස් හයකුත් ශත තිස් අටක (රු. 26,79,046.38) මුදල සහ 2007 ජූනි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් විසිහතර ලක්ෂ හැත්තෑ නව දහස් තුන්සිය තිස්හයකුත් ශත අනූ එකක් (රු. 24,79,336.91) සඳහා වර්ෂයකට සියයට විසිහත (27%) බැගින් පොලිය ද, රුපියල් තිස්දෙලක්ෂ හැත්තෑ අටදහස් හත්සිය අනූපහකුත් ශත විසිපහක් (රු. 32,78,795.25) මුදලක් සහ 2007 ජූනි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා ඒ සඳහා වර්ෂයකට සියයට තිස්හය (36%) බැගින් හෝ එම ණය පහසුකමට අදාළ වන වෙනත් අනුපාතිකයක් මත පොලිය ද, යන මුදල් ප්‍රමාණයන් සහ මෙහි පහත විස්තර කරන මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය අනුව එකී උකස් බැඳුම්කරවල ප්‍රඥප්ති ප්‍රකාර සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 462 හා 807 දරන උකස් බැඳුම්කර මගින් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙත උකස් කර ඇති, මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ, කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ සීමාසහිත ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

*අංක 462 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය*

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, අටුළුගම් කෝරළේ, අටුළුගම ග්‍රාමයේ පිහිටි කටුගහඹිවිට නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු ඒ. ඒ. රූපසිරි ආනන්ද විසින් මැන සාදන ලද අංක 993/6 හා 1999.03.06 වැනි දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 1 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට එකී පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : ඇළ ද, නැගෙනහිරට : අවිස්සාවේල්ල- කෑගල්ල ප්‍රධාන පාර ද, දකුණට : ඉහත කී පිඹුරේ ලොට් අංක 2 ද, බස්නාහිරට : අටුළුගම් ඔය ද යන මායිම් ඇතුළත් රූඩ් දෙකකුත්, පර්චස් දහතුනයි දශම අටයි බිංදුවයි හයක් (අ. 0, රූ. 2, පර්. 13.806) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ.

*අංක 807 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තරය*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කඳුපළාත් පත්තුවේ, යටිනුවර කෝරළේ, මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල බල ප්‍රදේශයට අයත් මාමුඩවෙල ග්‍රාමයේ පිහිටි කිරිමැල්ලගහමුලහේන නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ආර්. සී. ඕ. ද ලා මොට්ටේ විසින් මැන සාදන ලද අංක 3655 හා 1968.10.06 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් 5ඒ ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : පොත්තපිටියේ සිට කඩුගන්නාවට යන මහා පාර ද, නැගෙනහිරට : අංක 3655 දරන පිඹුරේ ලොට් අංක 5බී දරන කට්ටිය ද, දකුණට : ලොට් අංක 5ඩී ද, බස්නාහිරට : ලොට් අංක 01 සහ නත්තාරම්පොතහේන *නොහොත්* අද්දරපිල්ලෑහේන වත්ත ද යන මායිම් ඇතුළත රූඩ් දෙකකුත්, පර්චස් දොළහක් (අ. 0. රූ. 2, පර්. 12) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගසකොළ, වැවිලි, ගොඩනැගිලි හා වෙනත් සියලු දේ.

එල්. ජී. පෙරේරා,
කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි.

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව,
අංක 73, ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

11-749/3

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ :

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට, කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. වඳුරාගල විසින් ලියා සහතික කළ අංක 13687 හා 2006.11.01 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, "කරුණානායක ට්‍රේඩර්ස්" යන නාමය, අභිධානය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් ලෙස කුරුණෑගල ව්‍යාපාරය කරගෙන යන, කුරුණෑගල, කරුණානායක මුදියන්සේලාගේ ශාන්ත කුමාර කරුණානායක සහ හේරත් මුදියන්සේලාගේ අනුලාවතී යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2007 ජූලි මස 31 වැනි දිනට එකී කරුණානායක මුදියන්සේලාගේ ශාන්ත කුමාර කරුණානායක සහ හේරත් මුදියන්සේලාගේ අනුලාවතී යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් දසලක්ෂ විසිඅට දහස් තුන්සිය තිස් පහකුත් ශත අසූහයක (රු. 10,28,335.86) මුදලක් සහ 2007 අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් නවලක්ෂ හැටඅට දහස් පන්සිය දහනවයකුත් ශත හැටහතරක් (රු. 9,68,519.64) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනමක් මත පළකරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට වර්ෂයකට සියයට හතකුත් දශම පහක් (7.5%) වැඩි අනුපාතිකයක් වන, ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද, ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් දසලක්ෂ විසිඅට දහස් තුන්සිය තිස් පහකුත් ශත අසූහයක (රු. 10,28,335.86) මුදලක් සහ 2007 අගෝස්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා රුපියල් නවලක්ෂ හැටඅට දහස් පන්සිය දහනවයකුත් ශත හැටහතරක් (රු. 9,68,519.64) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනමක් මත පළකරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට වර්ෂයකට සියයට හතකුත් දශම පහක් (7.5%) වැඩි අනුපාතිකයක් වන, ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද සමඟ යන මුදල් ප්‍රමාණයක් සහ මෙහි පහත විස්තර කරන මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය අනුව හා එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව වැයකර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 13687 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර තිබෙන මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය, කොළඹ බලයලත් බැංකු වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### *අංක 13687 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, දේවමැදි උඩුකහ කෝරළේ, ගෝනව ග්‍රාමයේ පිහිටි තිඹිරිගහමුල පිටියවත්ත *නොහොත්* තිඹිරිගහ පිටියෙවත්ත නමැති ඉඩමේ බ්ලොක් ඉ කොටසට බලයලත් මිනින්දෝරු එස්. වෙලගෙදර විසින් මැන සාදන ලද අංක 3990 හා 2003.09.10 දින දරන පිඹුරේ ලොට් අංක 3 ලෙස දැක්වෙන බිම් කට්ටියට එකී පිඹුර ප්‍රකාර මායිම්, උතුරු-නැගෙනහිරට : වාරියපොල සිට කලුගමුවට යන මහ පාර, පොදු ළිඳ සහ බස් නැවතුම් පොළ (බස් හෝල්ට්) ද, දකුණු-නැගෙනහිරට : ඉහත කී පිඹුරේ ලොට් අංක 5 ද, දකුණු-බස්නාහිරට : එච්. එම්. ප්‍රේමවතී හිමිකම් කියන ඉඩම ද, උතුරු-බස්නාහිරට : ඉහත කී පිඹුරේ ලොට් අංක 2 ද යන මායිම් ඇතුළත පර්චස් දහනවයකුත් දශම පහක් (අ. 0, රූ. 0, පර්. 19.5) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි හා එයට අනුබද්ධ ගොඩනැගිලි වැවිලි හා වෙනත් සියලු දේ.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

11-749/1

---

## සීමාසහිත සෙලාන් බැංකුව-මාවනැල්ල ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.05.24 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතික ව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගිණුම් අංකය : 0480-06508430-001.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. පී. අයි. ගම්ලත් විසින් සහතික කරන ලද, 2001 නොවැම්බර් මස 16 දිනැති අංක 547 සහ 548 බැඳුම්කර සහ 2002 අප්‍රේල් මස 01 දිනැති අංක 570 සහ 571 බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, මාවනැල්ල පදිංචි රාජපක්ෂ මුදලිගේ ප්‍රියන්ත කුමාර මුදලිගේ යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දොළොස්ලක්ෂ හැටහත් දහස් තුන්සිය අනූ නවයයි ශත තිස්අටක (රු. 12,67,399.38) මුදලක්, 2006 අගෝස්තු මස 23 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 12,67,399.38 මුදල ද, 2006 අගෝස්තු මස 24 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස්තුන (33%) බැගින් වූ පොළිය සමඟ ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද, තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 547, 548, 570 සහ 571 දරන බැඳුම්කර මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස් කර ඇත්තා වූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකරු වන අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උපලේඛනය

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගල්බඩ කෝරළේ, මැද පත්තුවේ, මාවාන පිහිටි බලයලත් මිනින්දෝරු පී. ඩබ්ලිව්. නන්දසේන විසින් සාදන ලද 2000.05.02 දිනැති අංක 2050/ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන මැද්දේගොඩ වත්තේ අස්වැද්දුම කනටි නමැති ඉඩමේ කැබැලි අංක 1 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ ඉඩම් කොටසට මායිම්, වයඹට : මැද්දේගොඩ වත්ත ද, නැගෙනහිරට : ඇල සහ ප්‍රාදේශීය සභා පාර ද, දකුණට සහ නිරිතට : මැද්දේගොඩ වත්ත සහ මැද්දේගොඩ වත්තේ අස්වැද්දු කනටි ද, යන මායිම් තුළ පර්චස් දහයක් විශාල (අ. 0, රූ. 0, පර්. 10) ඉඩම. මෙය කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත් ඉරුව සී 706/75 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

11-721/2

---

## සීමාසහිත සෙලාන් බැංකුව-පරණ යොන් වීදිය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද සම්මුතිය

සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004.09.17 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගිණුම් අංකය : 0500-638114-001.

සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් සී. සච්ත්තානන්දන් විසින් සහතික කරන ලද 1999.11.30 දිනැති අංක 47 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, කොළඹ 12 රාජසිංහම් ඉන්ඩස්ට්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් දහ හතරලක්ෂ හතළිස් තුන් දහස් හාරසීයයි ශත දහ තුනක (රු.14,43,400.13) මුදලක්, 2004 ජනවාරි 30 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 14,43,400.13 මුදල ද, 2004 ජනවාරි 31 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසි හය (26%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 47 දරන බැඳුම්කරය මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස් කර ඇත්තාවූ

මෙහි පහත සඳහන් උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ඩන්ස්ටන් කෙලාර්ට් මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ ඉහළ යාගොඩ ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් සාදන ලද 1986.11.04 දිනැති අංක 544/1986 දරන මිනුම් සැලැස්මේ පෙන්නුම් කරනු ලබන යාගොඩ එස්ටේට් නමැති, එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ කැබලි අංක ඕ ලකුණු කල බෙදා වෙන් කළ ඉඩම් කොටසට මායිම් උතුරට : කැබලි අංක පී ද, නැගෙනහිරට : කැබලි අංක කේ (පාරක් සඳහා වෙන් කිරිම), දකුණට : කැබලි අංක එන් සහ බස්නාහිරට : මෙම ඉඩමේ බී කැබැල්ල යන මායිම් තුළ අක්කර බිංදුවයි රූඩ් බිංදුවයි පර්චස් එකොලහයි දශම නවයයි තුනක් (අක්කර 0, රූඩ් 0, පර්චස් 11.93) විශාල ඉඩම. මෙය ගම්පහ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් ඊ438/42 යටතේ ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ ඉහළ යාගොඩ ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් සාදන ලද 1986.11.04 දිනැති අංක 544/1986 දරන මිනුම් සැලැස්මේ පෙන්නුම් කරනු ලබන යාගොඩ එස්ටේට් නමැති, එහි පිහිටි සියලු දේ සමග ඉඩමේ කැබලි අංක ජී ලකුණු කල බෙදා වෙන් කළ ඉඩම් කොටසට මායිම් උතුරට : මහා මාර්ගය ද, නැගෙනහිරට : කැබලි අංක කේ (පාරක් සඳහා වෙන් කිරීම), දකුණට : ඕ කැබැල්ල සහ බස්නාහිරට : මෙම ඉඩමේ බී කැබැල්ල යන මායිම් තුළ අක්කර බිංදුවයි රූඩ් බිංදුවයි පර්චස් දහඅටයි දශම පහයි හයක් (අක්. 0, රූ. 0, පර්. 18.56) විශාල ඉඩම. මෙය ගම්පහ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් ඊ 297/156 යටතේ ලියාපදිංචි කර ඇත.

පෙර කී ඉඩම මෑතකදී එකතු කර සහ නැවත මැන ඇති අතර බලයලත් මිනින්දෝරු ඒ. ඒ. පී. ඒ. රංජිත් විසින් දෙකම 1999.06.02 දිනැති අංක 242 සහ 241 දරන සැලැස්මවල පෙන්වා සාදා පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය සභා සීමාව තුළ ඉහළ යාගොඩ ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ඒ. පී. ඒ. රංජිත් විසින් සාදන ලද 1999.06.02 දිනැති අංක 242 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන යාගොඩ එස්ටේට් නමැති, ඉඩමේ කැබලි අංක ඕ1 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් සාදන ලද 1986.11.04 දිනැති අංක 544/1986 දරන සැලැස්මේ පෙන්නුම්කරනු ලබන කැබලි අංක පී සහ ඕ වල කොටසක් එකතු කර නැවත මැනීමක් වන) බෙදා වෙන් කළ ඉඩම් කොටසට මායිම් උතුරට : බලයලත් මිනින්දෝරු ඒ. ඒ. පී. ඒ. රංජිත් විසින් සාදන ලද 1999.06.02 දිනැති අංක 241 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන පී 1 කැබැල්ල ද, නැගෙනහිරට : පාර ද, දකුණට : ජේ. ඒ. සිරියලතා කාන්තිගේ ඉඩම සහ බස්නාහිරට : රාජසිංහම් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් පරිශ්‍රය ද යන මායිම් තුළ අක්කර බිංදුවයි රූඩ් බිංදුවයි පර්චස් දාහතරයි දශම පහයි තුනක් (අක්. 0, රූ. 0, පර්. 14.53) විශාල ඉඩම.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ ගම්පහ ප්‍රාදේශීය සභා සීමාව තුළ ඉහළ යාගොඩ ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. ඒ. පී. ඒ. රංජිත් විසින් සාදන ලද 1999.06.02 දිනැති අංක 242 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන යාගොඩ එස්ටේට් නමැති, ඉඩමේ කැබලි අංක පී 1 ලකුණු කළ (බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් සාදන ලද 1986.11.04 දිනැති අංක 544/1986 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කැබලි අංක පී හි කොටසක නැවත මැනීමක් වන) බෙදා වෙන් කල ඉඩම් කොටසට මායිම් උතුරට : ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට : පාර ද, දකුණට : බලයලත් මිනින්දෝරු ඒ. ඒ. පී. ඒ. රංජිත් විසින් සාදන ලද 1999.06.02 දිනැති අංක 242 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඕ1 කැබැල්ල සහ බස්නාහිරට : රාජසිංහම් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් පරිශ්‍රය ද යන මායිම් තුළ අක්කර බිංදුවයි රූඩ් බිංදුවයි පර්චස් දහසයයි දශම අටයි බිංදුවක් (අක්. 0, රූ. 0, පර්. 16.80) විශාල ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,<br>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති).

11-720

---

## එම්. සී. බී. බැංකුව

### 2007 සැප්තැම්බර් මස 21 වැනි දින, මුදල් ගනුදෙනුව මගින් සම්මත කර ගත් අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මුතිය - ශ්‍රී ලංකා ශාඛාවේදී උකස් තබන ලද දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

යෝජනා සම්මුතිය අංක : 73/2007.

ශ්‍රී ලංකාවේ කොළඹ 12, සෙන්ට්‍රල් පාරේ, ඩී-1/1 දරන ස්ථානයේ සිටි ට්‍රාන්ස්පෝර්ට් සර්විසස් යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ වෙළඳ කටයුතු කරන සෝමසුන්දරම් ජෙගදීස්වරන් මහතා සහ කොළඹ 04, ලෝරිස් පාරේ, අංක 26/5හි සහයනායකී ජෙගදීස්වරන් විවාහයට පෙර වඩිවෙල් මහත්මිය උකස්කරුවන් ලෙස ප්‍රසිද්ධ නොතාරිස් වී. බාලසුබ්‍රමනියම් විසින් ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ශ්‍රී සංඝරාජ මාවත, අංක 542A දරන ස්ථානයේ සීමාසහිත එම්. සී. බී. බැංකුව (කලින් සීමාසහිත මුස්ලිම් කොමර්ෂල් බැංකුව) නමට ලියා සහතික කළ 2005 දෙසැම්බර් මස 13 දාතම හා අංක 3512 දරන උකස් බැදුම්කරය මත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

2007.08.31 වැනි දිනට රුපියල් එක් කෝටි අනූඑක්ලක්ෂ හැටදෙදහස් අටසිය අසූවකුත් ශත අසූදෙකක (රු. 1,91,62,880.82) මුදලක් සමග 2007 සැප්තැම්බර් මස 01 වැනි දින සිට වසරකට සියයට විසිපහ (25%) බැගින් පොලිය ද සමග අයවිය යුතුව ඇති හෙයින් ද,

එකී රුපියල් එක් කෝටි අනූඑක් ලක්ෂ හැටදෙදහස් අටසිය අසූවකුත් ශත අසූ දෙකක (රු. 1,91,62,880.82) මුදලක් සමග 2007 සැප්තැම්බර් මස 01 වැනි දින සිට වෙන්දේසි දින තෙක් වසරකට සියයට විසිපහ (25%) බැගින් පොළී මුදල ද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් වේනම් එය අඩුකොට අයකර ගැනීම සඳහා සහ 1995 අංක 24 දරන පනත මගින් සංශෝධිත 1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර අයකර ගත හැකි වෙනත් මුදල් ද සමග අයකර ගැනීම සඳහා එකී අංක 3512 මගින් සීමාසහිත එම්සීබී බැංකුවට (කලින් සීමාසහිත මුස්ලිම් කොමර්ෂල් බැංකුව) උකස් තබන ලද පහත උපලේඛනයන් හි වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර ඩන්ස්ටන් කෙලාට් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණාලිය යුතු බවට යෝජනා කොට සම්මත කර ගන්නා ලදී.

### පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහනගර සභා පරිපාලන සීමාව තුළ, නාගරික කොට්ඨාස අංක 39 මිලාගිරියේ බම්බලපිටිය, ලෝරිස් පාරෙන් හැරී මීටර් 3.05ක් (අඩි 10) පළල පාර ඔස්සේ පිහිටි, ලෝරිස් පාරේ, වරිපනම් අංක 26/5 දරන බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් සාදන

ලද 1996 අප්‍රේල් මස 27 දාතම හා අංක 5478 දරන පිඹුරේ ලොට් 5 වශයෙන් ලකුණු කොට නිරූපිත, කොළඹ ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව A768/265 යටතේ ලියාපදිංචි කොට ඇති එකී අංක 5478 පිඹුරට අනුව උතුරට : එකී අංක 216 පිඹුරේ ලොට් 6, මීටර් 3.05ක් (අඩි 10) පළල පාර සහ එකී අංක 216 පිඹුරේ ලොට් 4, ලෝරිස් පාරේ වරිපනම් අංක 26/4 ද, නැගෙනහිරට : ලෝරිස් පාරේ වරිපනම් අංක 30/1 ද, දකුණට : බම්බලපිටිය පාරේ වරිපනම් අංක 43/5A ද, සහ බටහිරට : බම්බලපිටිය පාරේ වරිපනම් අංක 37/1 හා 29/1 දරන පරිශ්‍රයන් ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් අටයි දශම හතයි පහක් (අ. 0, රූ. 0, පර්. 8.75) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ අනෙකුත් සියළුම දේ සමග.

### දෙවන උපලේඛනය

ඉහත කී බම්බලපිටියේ, ලෝරිස් පාර ඔස්සේ පිහිටි බලයලත් මිනින්දෝරු ආර්. එම්. අර්ථනායක විසින් සාදන ලද 1955 මැයි මස 07 දාතම හා අංක 216 දරන පිඹුරේ ලොට් 6 වශයෙන් ලකුණු කොට නිරූපිත කොළඹ ඉඩම් කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව A768/260 යටතේ ලියාපදිංචි කොට ඇති එකී අංක 216 පිඹුරට අනුව උතුරට : ලෝරිස් පාර, නැගෙනහිරට : එම පරිශ්‍රයේම ලොට් 1, 2. 3, 4 හා 5 ද, දකුණට : ලොට් 5 ද සහ බස්නාහිරට : ලෝරිස් පාරේ වරිපනම් අංක 24 සහ මැජෙස්ටික් ඇවනියු හි අංක 11 සහ ගාලු පාරේ අංක 30 ද මායිම් වන ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම තුනයි හතක් (අ. 0, රූ. 0, පර්. 11.37) වන බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ සම්පූර්ණ බිම් කොටස

අධ්‍යක්ෂ මණ්ඩලය,
එම්. සී. බී. බැංකුව.

11-790

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.